
# සුවෙන් පෙරට
# e ඉගෙනුම් පියස
# මිනුවන්ගොඩ

- ශ්‍රේණිය - 6
- විෂයය - ඉතිහාසය
- පාඩම - 05 - අපේ අතීත රජවරු


- සැකසුම - තමාලි පෙරේරා
  නියෝජ්‍ය විදුහල්පති
  මිනු/ බලබෝව කණිෂ්ඨ විද්‍යාලය


# ධාතුසේන රජතුමා



## ❖ ධාතුසේන රජු කවුරුන්ද ?

- පියා - දාඨානාම
- සොහොයුරා - සලතිස්බෝ

- ධාතුසේන රජතුමා මෞර්ය වංශිකයෙකි



- රජතුමාට පෙර අනුරාධපුරය පාලනය කළේ දකුණු ඉන්දියාවෙන් පැමිණි ආක්‍රමණිකයන් හයදෙනෙකි

පණ්ඩු , පාරින්ද , ඛුද්ධ පාරින්ද ,තිරීතර , දාඨිය , පීඨිය


- ඔවුන්ගෙන් රට නිදහස් කර ගත්තේ ධාතුසේන රජතුමාය




## ❖ ධාතුසේන රජතුමාගේ වාරිකාර්මික සේවාව

- රජතුමා මහ වැව් දහ අටක් හා කුඩා වැව් දහ අටක් ඉදි කරවීය

- ඒ අතරින් ප්‍රධාන වන්නේ කලා වැවයි



- කලා වැවේ සිට තිසා වැව දක්වා ඉදි කර ඇති යෝධ ඇළ ද ධාතුසේන රජු විසින් කරවන ලද්දකි
- එහි දිග සැතපුම් 54 කි
- මෙම ඇළ මාර්ගය  ජය ගඟ නමින් ද හැඳින්වේ
- එහි බෑස්ම සැතපුමට අඟල් හයකි




- මෙකල මිනිස්සුන්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තයයි
- එනිසා රජතුමා ඔවුන් වෙනුවෙන් බොහෝ වෙහෙසක් ගෙන වැව් අමුණු තැනවීය





- රජුට පුතුන් දෙදෙනෙක් හා දියණියක් සිටි බව සඳහන් වේ

- පුතුන් දෙදෙනා - කාශ්‍යප
  මුගලන්




- ධාතුසේන රජතුමා වෙහෙර විහාර දහ අටක් ඉදිකරවන ලද බව මහා වංශයේ සඳහන් වේ


- දිරාපත්ව තිබූ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණයටද රජු කැපවී කටයුතු කළේය

- මහාපාලි දාන ශාලාව ප්‍රතිසංස්කරණය කළේය

➢ රජුගේ රාජ්‍ය කාලය වසර දහ අටකි



- අවුකන බුදු පිලිමය තනවන ලද්දේද ධාතුසේන රජතුමාය





## ❑ ක්‍රියාකාරකම

1. ධාතුසේන රජුගේ පියා සහ සොහොයුරා නම් කරන්න
2. රජතුමා බලයට පත්වීමට පෙර අනුරාධපුරයේ බලය අල්ලාගෙන සිටි ද්‍රවිඩ ආක්‍රමණිකයන් හය දෙනා නම් කරන්න

3.රජු අයත් වන රාජවංශය නම් කරන්න

4.ධාතුසේන රජු ඉදිකළ වැව් අතරින් අදටත් ප්‍රයෝජනවත් වන වැව කුමක්ද

5.රජතුමා කලා වැවේ සිට තිසා වැව දක්වා ජලය ගෙනයාමට ඉදිකර ඇති ඇළ මාර්ගය නම් කරන්න

6.එහි දිග කොපමණද ?

7.එහි බැස්ම කොපමණද ?

8.මෙම ඇළ මාර්ගය හඳුන්වන තවත් නමක් ලියන්න

9.බුදු දහමේ දියුණුව උදෙසා රජු ගත් ක්‍රියාමාර්ග මොනවාද?

10.ධාතුසේන රජුගේ පුතුන් දෙදෙනා නම් කරන්න

11.රජුගේ රාජ්‍ය කාලය කොපමණද ?

ස්තූතියි!

තමාලි පෙරේරා